**ජාතික මහමාර්ග ආංශික ව්‍යාපෘතිය - 2015**

-------------------------------------------------

ජාතික මහමාර්ග ආංශික ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2006 දෙසැම්බර් 14 දින එළඹි අංක 2217 එස්ආර්අයි දරන ණය ගිවිසුමේ 6 උපලේඛනයේ 34 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-------------------------------------------------------------------------------------

ණය ගිවිසුම අනුව, එවකට වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය, වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ජාතික මහමාර්ග ජාලයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම හා මාර්ග අංශයේ ආයතන සවිබල ගැන්වීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 23,760 කට සමාන එජඩො මිලියන 216 ක් වූ අතර ඉන් රු. මිලියන 16,500 කට සමාන එජඩො මිලියන 150 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණි. ශ්‍රී ලංකා රජය විසින් ආසියානු සංවර්ධන බැංකුව සමඟ 2008 පෙබරවාරි 15 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කළ අතර ඒ අනුව, මුල් ණය වටිනාකම ඇතුළත ව්‍යාපෘති විෂය පථය වෙනස්කිරීම සඳහා 2008 මැයි 27 දින ණය ගිවිසුම සංශෝධනය කර තිබුණි. ඉහත ගිවිසුමට අමතරව, අංක 1355 පී දරන තවත් ණය ගිවිසුමක් ශ්‍රී ලංකා රජය විසින් ආර්ථික සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල සමඟ 2010 ඔක්තෝබර් 04 දින අත්සන් කර තිබුණු අතර මෙම ව්‍යාපෘතිය මඟින් රු.මිලියන 880 කට සමාන එජඩො මිලියන 8 ක් වෙන්කිරීමට ආර්ථික සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල විසින් එකඟ වී තිබුණි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතිය එහි කටයුතු 2006 අප්‍රේල් 07 දින ආරම්භ කරන ලද අතර 2012 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. ආර්ථික සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදලේ මූල්‍යායන කටයුතු 2015 ජූනි 30 දින අවසන් කර තිබුණි. කෙසේ වෙතත් 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට

අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරික්ෂා කිරීම්ද එම පරික්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව , සහ

(ඉ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

අලුතෙන් ඉදිකරන ලද මහමාර්ග ලේකම් කාර්යාල ගොඩනැගිල්ල වෙනුවෙන් විදුලිය, ජලය, ආරක්ෂාව සහ පිරිසිදු කිරීමේ ගාස්තු ආදි පිරිවැය දැරීමට ව්‍යාපෘතිය විසින් වැය කරන ලද රු.මිලියන 3.90 ක් ප්‍රාග්ධන පිරිවැය ලෙස හඳුනාගෙන තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම්වල මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | උපයෝජනය කළ අරමුදල් 2015 වර්ෂය තුළ | | උපයෝජනය කළ අරමුදල් 2015 දෙසැම්බර් 31 දින දක්වා | |
|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආසංබැ | 150.00 | 16,500 | - | - | 150.00 | 17,272 |
| ආර්ථික සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල | 8.00 | 880 | - | - | 8.00 | 928 |
| ශ්‍රීලංර | 58.00 | 6,380 | 6.79 | 964.39 | 64.04 | 9,090 |
| | **216.00** | **23,760** | **6.79** | **964.39** | **222.04** | **27,290** |

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අනුව, ජාතික මාර්ග 06 ක් පුනරුත්ථාපනය කිරීම හා මහමාර්ග ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට ව්‍යාපෘතිය විසින් අපේක්ෂා කර තිබුණි. ලැබුණු තොරතුරු අනුව, සියලුම මාර්ග පුනරුත්ථාපන වැඩ 2014 දෙසැම්බර් 31 දිනට නිමකර තිබුණි. කෙසේ වෙතත් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ අදියර iii ඉදිකිරීම් වැඩ ශ්‍රී ලංකා රජයේ දායකත්වයෙන් 2015 දෙසැම්බර් 31 දක්වා සිදුකරමින් තිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහාමාර්ග ලේකම් කාර්යාලය වෙනුවෙන් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුවේ සමස්ත මහල් අටක ගොඩනැගිල්ලේ පළමු මහල් තුන සම්පූර්ණ කිරීමට 2010 අගෝස්තු 17 දින රු. මිලියන 599.30 ක පිරිවැයකට පුද්ගලික පාර්ශවයන් වෙත පිරිනමා තිබුණු අතර 2011 නොවැම්බර් 04 දින වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත් මහල් තුන ඉදිකිරීම සියයට 90 ක් සම්පූර්ණ වන අවස්ථාවේදී අනෙක් මහල් පහ ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව පළමු කොන්ත්‍රාත්තුවේ විචලනයක් ලෙස රු.මිලියන 568.14 ක අමතර පිරිවැයකට එම කොන්ත්‍රාත්කරු වෙතම පිරිනමා තිබුණි. තවද, රු.මිලියන 795.72 ක ඇස්තමේන්තුගත පිරිවැයකට ගොඩනැගිල්ල තවත් මහල් දෙකකින් වැඩිකිරීමට 2012 ජුනි මාසයේදී ව්‍යාපෘති නියාමන ඒකකය තීරණය කර තිබුණි. එමනිසා මහල් දහයකින් සමන්විත ගොඩනැගිල්ලේ මුළු අපේක්ෂිත පිරිවැය රු.මිලියන 2,506.54 ක් විය. ශ්‍රී ලංකා රජයේ දායකත්වයෙන් අතිරේක පිරිවැය දැරීමට ඉහත සඳහන් සියලු අදියරයන් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් තවදුරටත් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉදිකිරීම් වැඩ විෂය පථයෙහි වෙනස්කම් නිරන්තරයෙන් සිදුකර තිබුණු බව නිරීක්ෂණය වූ අතර එවැනි පරිවයන් මඟින් ගොඩනැගිල්ලේ අදියර iii යටතේ සිදු කරන ලද අතිරේක ඉදිකිරීම් වැඩමත සියයට 13 සිට සියයට 68 ක් දක්වා පරාසයක විවිධ රේට භාවිතා කිරීමට ඉඩකඩ ලැබී තිබුණි.

(ii) විදුලි ජනක යන්ත්‍ර, භූගත ඉන්ධන ටැංකිය, දත්ත ජාලය, සේවා පද්ධතිය, විදුලි ආරෝහක හා වායුසමීකරණ පද්ධතිය ආදී උපාංග කිහිපයක් කොන්ත්‍රාත්කරුගෙන් රු. මිලියන 495.39 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කර ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ප්‍රධාන කොන්ත්‍රාත්තුවේ විචලනයන් ලෙස සලකා තිබුණු බවත් මුල් ප්‍රමාණ පත්‍රයෙහි එම විෂයයන් ඇතුළත් කර නොතිබූ බවත් නිරීක්ෂණය විය. එමනිසා පොදුකාර්ය, සවිකිරීමේ ගාස්තු, ලාභ ආන්තික ආදිය මත සියයට 35 ක් දක්වා අමතර ගාස්තු ඉල්ලීමට කොන්ත්‍රාත්කරුට ඉඩ සලසා තිබුණි. ඊට අමතරව වාහන ගාල් කිරීමේ කාර්යයන් සඳහා ඉඩකඩ සැලසුම් කර නොතිබුණු අතර ඒ සඳහා අමතර ස්ථාන ලබා දීමට සිදුවී ඇත.

(iii) රු. මිලියන 259.42 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද දත්ත ජාල පද්ධතිය, සේවා පද්ධතිය, පොදු ඇමතුම් පද්ධතිය, විද්‍යුත් සවිකිරීම්, වායුසමීකරණ පද්ධතිය, විදුලි සෝපාන ආදී ගොඩනැගිල්ලේ උපකරණ හා සවිකිරීම් කිහිපයක අඩුපාඩු විගණකවරුන් විසින් සිදුකළ ස්ථානීය පරීක්ෂණයන්හිදී නිරීක්ෂණය විය. කෙසේ වෙතත් එම අඩුපාඩු පිළිසකර කිරීමට කටයුතු කර නොතිබුණු බවත් උපකරණ හා සවිකිරීම් දිගු කාල පරිච්ඡේදයක් ඉදිකිරීම් වැඩබිමේ නිෂ්කාර්යව පැවතුණු බවත් 2015 දෙසැම්බර් 31 දිනට වගකීම් කාලය ඉකුත් වී ඇති බවත් තවදුරටත් නිරීක්ෂණය විය.

(iv) ගොඩනැගිල්ලේ අදියර iii යටතේ ඉදිකිරීම් වැඩ සඳහා එකඟ වූ මුදලට අතිරේකව කිසිදු අමතර ඉල්ලීමක් ඉදිරිපත් නොකරන බවට 2012 නොවැම්බර් 17 දිනැති අංක සී/369/10/එච්එස්බී-එච්ඕ/2013 දරන ලිපිය මඟින් කොන්ත්‍රාත්කරු විසින් එකඟ වී තිබුණද සේවකයින් රඳවා ගැනීම, වැඩබිමේ ඇති අමුද්‍රව්‍ය හා ප්‍රවාහන ගාස්තු ආදිය සඳහා එකතුව රු. මිලියන 6.14 ක් වූ අතිරේක ඉල්ලීම් සමාලෝචිත වර්ෂය තුළදී සිදු කර තිබුණි.

(v) කොන්ත්‍රාත් ගිවිසුමේ 14.10 වගන්තිය අනුව, කොන්ත්‍රාත් කාලය අවසාන වන දිනට කොන්ත්‍රාත්කරු විසින් වැඩ නිම කිරීමේ වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, 2015 දෙසැම්බර් 31 දිනට වැඩ නිම කිරීමේ වාර්තාවක් ඉදිරිපත් කිරීමෙන් තොරව කොන්ත්‍රාත්කරු රු. මිලියන 2,057 ක් වටිනා අවසාන බිල්පත ඉදිරිපත් කර තිබුණි.

(ආ) ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ අභ්‍යන්තර සැලසුම් වැඩ සඳහා කොන්ත්‍රාත්තුව පිරිනමා 2015 දෙසැම්බර් 31 දිනට ඒ වෙනුවෙන් රු. මිලියන 21.03 ක් ගෙවා තිබුණද උපදේශන ගිවිසුම මෙහි අවශ්‍ය පරිදි පසුතල සැලැස්ම හා අවශ්‍ය සිතියම් රේඛන උපදේශක විසින් සපයා නොතිබුණි. කෙසේ වෙතත් ගෘහ භාණ්ඩ හා උපකරණ රු.මිලියන 87.13 ක පිරිවැයකට සැපයීම සඳහා 2015 පෙබරවාරි 17 දින වෙනත් පාර්ශවයක් වෙත කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණු අතර පසුතල සැලසුම් නොමැතිවීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව 2016 අප්‍රේල් 30 දින වන විටත් සම්පූර්ණ කිරීමට නොහැකිවී තිබුණි. තවද, ගෘහභාණ්ඩ සැපයීම මත රු. මිලියන 26.73 ක විචලතාවයන්ද ගොඩනැගිල්ලේ මහල් 06 ක් සඳහා සිවිලිම් සැපයීම හා සවිකිරීම මත රු. මිලියන 39.63 ක විචලනයන්ද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.13.4 ඡේදයට පටහැනිව ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් අනුමත කර ගෙවා තිබුණි.

### 3.4 ව්‍යාපෘති කාර්යයන් නිම කිරීම

--------------------------------

ණය සපයනු ලබන නියෝජිතායතන මූල්‍යායනය සැලසුම් 2015 ජූනි 30 දිනට අවසන් කර තිබුණද, ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වෙත ව්‍යාපෘතියේ වත්කම් හා වගකීම් පැවරීමෙන් පසුව අවසන් කිරීමේ ගිණුම් සකස්කර ඉදිරිපත්කිරීමට කටයුතු කර නොතිබුණි.